72185


# ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
## தேசிய சம்பளங்கள் மற்றும் ஆளணி ஆணைக்குழு
## NATIONAL SALARIES AND CADRES COMMISSION

කාමර අංක 2-116, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
அறை இல. 2-116,பண்டாரநாயக்க ஞாபகார்த்த சர்வதேச மாநாட்டு மண்டபம், பௌத்தாலோக மாவத்தை, கொழும்பு 07.
Room No.2-116, B.M.I.C.H, Bauddhaloka Mawatha. Colombo 07

දුරකථන / தொலைபேசி / Telephone: 2669134
ෆැක්ස් / பக்ச் / Fax: 2669134
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: nscc@sltnet.lk


මගේ අංකය / எனது இல. / My No.: NSCC/01/GP/14/1-III
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2016.05. 23

27 MAY 2016

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 ට අනුව විශ්‍රාම වැටුප් ගැලපීම**
**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික නිලධාරීන්ගේ වැටුප් ක්‍රම හඳුනා ගැනීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් ජාතික වැටුප් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද ඔබගේ අංක විවැ/6/2006/ක/1 හා 2015.11.05 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින් විමසා ඇති කරුණ සම්බන්ධයෙන් ජාතික වැටුප් කොමිෂන් සභාවේ අංක NPC/01/GP/14/1 හා 2015.12.16 දිනැති ලිපිය මගින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් තොරතුරු විමසන ලදී. ඒ අනුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක HR12/ වි.වැ.(පොදු) හා 2016.01.26 දිනැති ලිපිය මගින් අදාල තොරතුරු ඔබටද පිටපතක් සහිතව මෙම කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

03. එම ලිපියෙහි දක්වා ඇති පරිදි අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ගේ අංක අමප/00/1799/03/124 හා 2000.10.04 දිනැති තීරණය අනුව එදිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාලේඛන විමර්ශන නිලධාරීන්, සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරටත්, සංඛ්‍යාලේඛන නිලධාරීන්, සංඛ්‍යාලේඛනඥ තනතුරටත්, සංඛ්‍යාලේඛනඥ නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ තනතුරටත් අන්තර්ග්‍රහණය කර ඇත. 2000.10.04 දිනට පෙර විශ්‍රාම ලැබූ නිලධාරීන් සම්බන්ධයෙන් එම ප්‍රතිව්‍යුහගත යෝජනා ක්‍රියාත්මක කරනු ලබන බව එම තීරණයෙහි සඳහන් වී නොමැති බව ඉහත ලිපිය මගින් දන්වා ඇත.

04. ඒ අනුව 2000.10.04 දිනට පෙර විශ්‍රාම ලැබූ ඒ.කේ.ඥානවර්ධන හා යූ. මුනිදාස යන විශ්‍රාමික නිලධාරීන් සඳහා ඉහත 02 ඡේදයෙහි සඳහන් ප්‍රතිව්‍යුහගත යෝජනා අදාල කර ගත නොහැකි බව නිරීක්ෂණය කෙරේ. එබැවින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/2015 අනුව විශ්‍රාම වැටුප සංශෝධනය කිරීමේදී ඔවුන් විශ්‍රාම ලබන විට දැරූ තනතුරු අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

අශෝක ජයසේකර
ලේකම්,
ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව.

පිටපත: අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - කරු දැ.ගැ.ස.